මැයි 9, 2022 දින ගාලුමුවදොර විරෝධතාකරුවන්ට පහර දීමේ සිදුවීම සම්බන්ධයෙන්, මැයි 24, 2022 දින පාර්ලිමේන්තු මන්ත්‍රී ජොන්ස්ටන් ප්‍රනාන්දුගෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පැය පහක පමණ කාලයක් ප්‍රකාශ සටහන් කරගත් බව මාධ්‍ය වාර්තා කර තිබේ. හිටපු අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනන්දු අත්අඩංගුවට ගන්නා ලෙසින් බල කරමින්, අරගල භූමියේ පිරිසක් ද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණ විරෝධතාවයක නිරත වූ බවද එසේම වාර්තා වී තිබිණි.

මේ සම්බන්ධයෙන් මැයි 24, 2022 දින ස්වාධීන රූපවාහිනී සහ ජාතික රූපවාහිනී රාත්‍රී ප්‍රධාන සිංහල පුවත් විකාශයන් ඔස්සේ අඩු වැඩි වශයෙන් ආවරණය වී තිබුණේ මෙසේයි.

(මෙම දත්ත සටහන සඳහා භාවිතා වී ඇත්තේ මැයි 24, 2022 දින ස්වාධීන රූපවාහිනී සහ ජාතික රූපවාහිනී රාත්‍රී ප්‍රධාන සිංහල පුවත් විකාශයන් පමණක් වන අතර, එදින එම නාලිකාවන් හි වෙනත් වේලාවන් හි විකාශය වූ පුවත් තුළ මීට වෙනස් දත්ත ඇතුලත් විය හැක.)